CSIAP

THE WORLD BANK

# දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP) සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.

## කෘෂිකර්ම අමාත්‍යාංශය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) චක්‍රලේඛ අංක 01/2019 සහ රජයේ බඳවාගැනීම් ක්‍රියාපටිපාටීන් ප්‍රකාරව, ලෝක බැංකුවේ අරමුදල් සපයනු ලබන දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP) සඳහා "කොන්ත්‍රාත් පදනමින්" කාර්යමණ්ඩල සාමාජිකයන් බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) අංක 01/2019 චක්‍රලේඛයේ වගු අංක 03 හි 03 න් වෙනි තීරුවේ මෙම තනතුරු සඳහා වැටුප් ප්‍රමාණයන් සඳහන් කර ඇත.

අයදුම්රුවන්, වයස අවුරුදු 64 කට අඩු අය විය යුතුය. ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය හා රජයේ රෙගුලාසි පිළිබඳ දැනුවත්භාවය සමඟ පරිගණක සාක්ෂරතාවය අත්‍යාවශ්‍ය පූර්ව සුදුසුකම් වේ. ශ්‍රී ලංකාවේ විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල සේවය කොට තිබීම හා අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකම් වේ.

| අංකය | PS වර්ගීකරණය | තනතුර | තනතුරු ගණන | අදාළ චක්‍රලේඛය |
|---|---|---|---|---|
| 01 | PS 2 | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා | 01 | MSD චක්‍රලේඛ 01/2019 |
| 02 | PS 3 | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු (ජල කළමනාකරණ) ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා | 01 | |
| 03 | PS 3 | ජල සම්පත් හා මෙහෙයුම් විශේෂඥ, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා | 01 | |
| 04 | PS 4 | ව්‍යාපෘති ගණකාධිකාරී, උතුරු මැද පළාත සඳහා | 01 | |
| 05 | PS 6 | පරිසර ආරක්ෂණ නිලධාරී, ඌව පළාත සඳහා | 01 | |
| 06 | PS 6 | මෙහෙයුම් හා ඇගයීම් නිලධාරී, උතුරු පළාත සඳහා | 01 | |

අවශ්‍ය වැඩිදුර තොරතුරු සඳහා www.csiap.lk අඩවිය වෙත යොමු වන්න.

එක් එක් තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් සකස් කොට 2022.12.12 දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අදාළ කවරයේ ඉහළ කෙළවරේ වම් පස අයදුම්කරනු ලබන තනතුර සඳහන් කල යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ**
**නො: 61/1, එම්. ඩී. එච්. ජයවර්ධන මාවත**
**මාදින්නාගොඩ**
**රාජගිරිය**

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබයි. මේ සඳහා බලපෑම් කිරීම නුසුදුසුකමක් සේ සලකනු ලබන අතර එවන් අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
දිනය : 2022.11.28